(01) ජන කලා කේන්ද්‍රයේ පැවැත්වූ දේශීය කලා කර්මාන්ත ප්‍රදර්ශණයේ දී "දේශීය දේ අගයමු" තේමාව යටතේ දේශීය නිෂ්පාදන මෙන්ම නව අත්කම් භාණ්ඩ ද නිර්මාණය කර තිබුණි. මෙම ප්‍රදර්ශනය නැරඹීම සඳහා පාසල් සිසුන්ට ද අවස්ථාව ලබා දී තිබුනි.

(1) අත්කම් භාණ්ඩ සෑදීමට භාවිත කළ හැකි දේශීය ශාක වර්ග දෙකක් ලියන්න.

(2) එම ශාක වර්ගවලින් නිර්මාණය කළ හැකි අත්කම් භාණ්ඩ දෙකක් නම් කරන්න.

(3) ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා යොදා ඇති පොල්තෙල් පහන සෑදීමට ගත හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න.

(4) ප්‍රදර්ශන කුටි අලංකාර කිරීමට සුදුසු මල් වර්ග 04 ක් නම් කරන්න.

(5) ප්‍රදර්ශන කුටියට ඇතුළු වන දොරටුව දෙපස පුන්කලස් තබා තිබුණි. එම පුන්කලස් සැරසී මට ගත හැකි දේශීය ශාක වර්ග 02ක් ලියන්න.

(6) නිවේදන පුවරුව අලංකාර කිරීමට සුදුසු ස්වාභාවික ද්‍රව්‍ය 02ක් ලියා එහි දළ රූප සටහනක් අඳින්න.

(7) රෙදි කැබලි ආශ්‍රයෙන් කළ හැකි නිර්මාණ 02ක් ලියන්න.

8) ස්වාභාවික ඇට වර්ග සහ කෘතිම පබළු වර්ග යොදා ගනිමින් ඉතා අලංකාර නිර්මාණ කර තිබුනි. එයින් ඔබ කැමති නිර්මාණ 02ක් ඇඳ දක්වන්න.

(9) ප්‍රදර්ශන කුටියක තබා තිබූ එක් එක් වර්ගයේ වෙස් මුහුණු දක්නට තිබුණි. නරඹන්නන්ට ද ඉතා ප්‍රියජනක විය. වෙස් මුහුණු වර්ග 02ක් නම්කර ඔබ කැමති වෙස් මුහුණක් ඇඳ දක්වන්න.

(10) ඉහත දක්වා ඇති තේමාවට අනුව වෙනත් තේමා පාඨයක් නිර්මාණය කරන්න.

(02) ශ්‍රී ලාංකිකයින් වන අප සිව්සැට කලාවකට උරුමකම් කියති.

(1) ජන කලාවේ ප්‍රධාන කොටස් කීය ද? ඒ මොනවා ද? (ලකුණු 02)

(2) ජන කලාවට අයත් කර්මාන්ත 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(3) පියපුතු උරුමයෙන් පාරම්පරිකව පැවත එන කර්මාන්තය නම් කර එම කර්මාන්තය ප්‍රචලිත ප්‍රදේශ 03ක් නම් කරන්න.